(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 105. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2021 නොවැම්බර් 10 බදාදා පූ. භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** විදේශ අමාත්‍යතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **බැසිල් රෝහණ රාජපක්ෂ මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෛයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **නසීර් අහමඩ් මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **(මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **සාගර කාරියවසම් මහතා**

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සු. නෝගරාදලිංගම් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

1.**ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2017 වර්ෂය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) කම්කරු අමාත්‍යවරයා විසින් 2018 සහ 2019 වර්ෂ සඳහා සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර එම වාර්තා, කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(6) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් —

(i) 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා ජාතික යොවුන් සේනාංකයේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2018 වර්ෂය සඳහා ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, තරුණ හා ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) සේවකයන් විශ්‍රාම යාමේ අවම වයස පනත් කෙටුම්පත; සහ

(ii) කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) තලාව, දළදාපුර, අංක 419/02/45 දරන ස්ථානයෙහි පදිංචි ඒ. ඒ. කේ. ඊ. විජේසිංහ මහතාගෙන් ලැබුණු 2021.07.15 දිනැති පෙත්සම; සහ

(ii) තන්තිරිමලය, කිවුලේකඩ යන ලිපිනයෙහි පදිංචි එච්. මුතුවා මහතාගෙන් ලැබුණු 2021.04.24 දිනැති පෙත්සම

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා විසින් පිළිගන්වන ලදී.

(2) මීරිස්ස, උඩුපිල, කස්තුරිගේ වත්ත යන ලිපිනයෙහි පදිංචි කේ. කේ. පියවතී මෙනවියගෙන් ලැබුණු 2021.03.16 දිනැති පෙත්සම ගරු නිපුණ රණවක මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීම:** අධිකරණ අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— පුද්ගලනාශක බිම්බෝම්බ භාවිත කිරීම, තොග රැස්කිරීම, නිපදවීම සහ පැවරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම පිළිබඳ සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 නොවැම්බර් 17 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**5. අධිකරණ සංවිධාන (සංශෝධන):** අධිකරණ අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 නොවැම්බර් 17 බදාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 4 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු බුද්ධික පතිරණ මහතා, ගරු වරුණ ලියනගේ මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

"සහන ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**8. විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය " යි මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් වරාය හා නාවික අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

"ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 11.45 ට ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

"ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා, ගරු මුජිබුර් රහුමාන් මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.30 ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ශානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මූලාසනාරූඪ විය යුතු ය"යි කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ලූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.32 ට ගරු ශානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි වාරිමාර්ග අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.33 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.02 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය"යි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වන වගන්තියේ සිට 3 වන වගන්තිය දක්වා සභා සම්මත විය.

**ප්‍රඥප්ති වගන්තිය සහ නාමය**

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය"

යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තෙවැනිවර කියවිය යුතු ය යි" අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තෙවැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**9. ආගාමික හා විගාමික (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය "යි අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වරාය හා නාවික අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය"යි වාරිමාර්ග අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1වන වගන්තියේ සිට 3වන වගන්තිය දක්වා සභා සම්මත විය.

**ප්‍රඥප්ති වගන්තිය සහ නාමය**

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තෙවැනිවර කියවිය යුතු ය"යි වාරිමාර්ග අමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තෙවැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**10. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි:** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් වරාය හා නාවික අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු, 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 2247/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.21 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය:** අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වරාය හා නාවික අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2021 ඔක්තෝබර් 29 දිනැති අංක 2251/64 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2021.11.08 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. කල් තැබීම (කුලියාපිටිය රෝහල අංග සම්පූර්ණ ශික්ෂණ රෝහලක් කිරීම):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල්තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින් විවාද විය.

"ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි මහජන ආරක්ෂක අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.28 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය. )

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 නොවැම්බර් 11 බ්‍රහස්පතින්දා පූ.භා. 10.00 වනතෙක් කල් ගියේය.